# පොත පතින්

**“ ඉසුර ” සංවර්ධන සංග්‍රහය 6 වෙළුම 11 කළඹ**

# මිහිතලයේ ගීතය

වොෂිංටන් නගරයෙහි වැජඹෙන උතුම් ජන නායකයන් අප වාසය කරන මේ භූමිය මුදලට ගැනීමට ඔහුට අවශ්‍ය බව දන්වා අපට පණිවිඩයක් එවා ඇත. උතුම් ජන නායකයානන් ඔහුගේ සුබ පැතුම් සමග සුහද බව පිරි පණිවිඩයක් ද මා වෙත එවා ඇත. ඒ ඉතා කාරුණික කමෙකි. මන්ද? ඔහුට අපගේ සුහදතාවයෙන් අල්ප මාත්‍රයක වත් ප්‍රයෝජනයක් නොමැති බව අප දන්නා බැවිනි. ඔහුගේ යෝජනාව අප සළකා බැලිය යුතුව ඇත.

අප එසේ නොකළොත් තුවක්කු රැගත් සුදු මිනිසුන් පැමිණ අප අද වෙසෙන මේ භූමිය අපෙන් බලහත්කාරයෙන් උදුරා ගන්නා බව අපි දන්නෙමු.

මිහිතලයෙහි උණුසුමක් අනන්තය දක්වා නිදහසේ පැතිරී පවතින අහස් තලයත් මිලක් නියම කර විකිණිය හැකි වස්තූන් ද? මෙය අප තුළ නම් විශ්මය දනවන අදහසකි. පාවෙන සුළඟේ ඇති නැවුම් සුවඳත්, ගලා බසින දිය දහර මත ආලෝකය වැටී එයින් විසිර දුවන කාන්තියත් අපට අයිති කරගත නොහැකි ආශ්වර්යවමත් වස්තූන් නම් එවැනි දේ ඔබ මිලට ගන්නේ කෙසේ ද ?

මෙම ධරණී තලයෙහි ඇති සෑම වස්තුවක් ම මගේ සහෝදර ජනතාව සතු පූජනීය වස්තූන් වේ. සෑම කස ගසක නටුවක් ම, සෑම තැනිතලාවක් ම සෑම බඹරෙක් ම, අඳුරු වන දෙස වසා වැටෙන සෑම මීදුම් සළුවක් ම මගේ සොහොවුරන්ගේ අත්දැකීම් හා මතකය තුළ ඇති පූජනීයත්වයට පත් වී හමාර ය. මෙම භූමියේ වැඩෙන සෑම ගසක් තුළ දිවෙන ජීවයේ හරය කැටි කරගත් සෑම ඕජා බිංදුවක් ම රතු ඉන්දීය වර්ගයාගේ මතක සටහන් ගැබ්කර ගත්තා සේ ය.

සුදු මිනිසුන් මෙම මිහිතලය අපේ නිජබිම බව අමතක කර දමති. අප මලවුන්සේ සලකා මෙම ධරණී තලය ඔවුන්ගේ සිත් සතන් තුළ සදහටම නිධන් කර ගනිති.

ඒ ඇයි? මේ මිහිතලය රතු ඉන්දියන් වර්ගයාගේ මෑණියන් වන බැවිනි. සුවඳ වැහෙන සෑම පිවිතුරු කුසුමක් ම අපගේ සොයුරියෝ වෙත් මුව පොව්වන් සෛන්ධර්වයන් සහ ගුවන සිසාරා නිදහසේ ඉගිල යන රාජාලියන් අපගේ සොහොයුරෝ ය. කඳු මුදුන්වල උස්ව නැගී සිටින ගල් කුළුත් බඩවැටි වල උණන දිය සීරාවත් අශ්වයන්ගේත් මනුෂ්‍යයන්ගේත් සිරුරුවල පවත්නා උණුසුමත් එකම පවුලක් වැනි වූ වස්තූන් ය.

එබැවින් වොෂිංටන් නුවර උතුම් ජන නායකයානෝ අප ගෙන් ඉල්ලා එවා ඇත්තේ මිළ කළ නොහැකි වස්තු සම්භාරයකි.

ඔබ අපට ජීවත් වන්නට වෙනත් පෙදෙසෙක බිමක් වෙන්කර දෙන බවත්, අපට එහි සුවසේ විසිය හැකි බවත් දන්වා එවා ඇත. ඔබ අපට පියකුමෙන් එම පණිවිඩය එවා ඇත.

## විජිත නක්කාවිට

අප වාසය කරන මෙම භූමිය මුදලට අප විකිණිය යුතු යැයි ඔබ කරන යෝජනාව අප සළකා බැලිය යුතුව ඇත. එහෙත් එය ලෙහෙසි කටයුත්තක් නොවේ. මෙම භූමිය අපගේ පූජනීය නිජ බිම බැවිනි.

මේ බිම පුරා ගලන ගංගාවන්හීත්, ඇළ දොළේත් හිරු රැසින් දිලිහෙමින් මනස්කාන්තව ගලා බසින දිය දහර සැබැවින් ම ජලය නොවේ. එය මගේ මුතුන් මිත්තන් ගේ පරම පිවිතුරු රුධිර ධාරාවයි. අප



ඔබට අපේ භූමිය විකුණුව ද මේ භූමිය පූජනීය බව ඔබ මතක තබා ගත යුතු ය. එය පූජනීය වස්තුවක් ලෙස ම සැළකිය යුතු ය. ඒ බව ඔබ ඔබේ දරුවන්ට ද උගැන්විය යුතුම ය.

විලක පැහැදිලි දිය මත වැටී තිබෙන සෑම ඡායාවක් ම අපගේ මුතුන් මිත්තන්ගේ ඉතිහාසයෙහි සිද්ධීන් හා ඒවායේ මතක සටහන් බව ද ඔබ ඔබේ දරුවන්ට උගැන්විය යුතු වෙයි. බැස යන දිය දහර මත සුළඟ වැටෙන විට ඇති වන සිහින් කෙඳිරිය වැනි හඬ මගේ පියාණන්ගේත් මුතුන් මිත්තන්ගේත් කටහඬවල ප්‍රතිරාවයයි. ගංගාවන් අපගේ සොහොයුරන් මය. ඔවුහු අපගේ පවස සංසිඳුවති. ගංගා අපගේ ඔරුවල බර ඔසවා ගෙන සිටිති. ඔවුහු අපගේ දරුවන්ගේ කුස ගිනි නිවති. අප අපේ භූමිය යම් මුදලකට ඔබට විකුණුවහොත් ගංගාවන් ඔබේ ද සොහොයුරන් වනු ඇත. එබැවින් මේ තැන් සිට ඔබ ද ගංගාවන්ට ඔබේ සොහොයුරන්ට මෙන් කරුණාන්විත ව සැළකිය යුතු වෙයි.

කඳුවැටියට ඉහළින් නැගෙන මීදුම, හිරු රැස් ඉදිරියේ පලා යන්නාක් මෙන් රතු ඉන්දියන්වරු සුදු මිනිසා ඉදිරියට එන විට, පසු බැස යති. එහෙත් මගේ මුතුන් මිත්තන් ගේ පූජනීය භෂ්මාවශේෂ තැන්පත් කර ඇති, ඔවුන්ගේ සොහොන් බිම බවට පත් වූ මෙම භූමිය සදා පූජනීය වූ බිමෙකි. එහෙයින් මෙම කඳු වැටින් තුරු ලතාවන් හා අප ජීවත්වන මෙම දෙරණත් අපි සදාකාලිකව ම වන්දනා කරන්නෙමු.

සුදු මිනිසාට අපගේ ගති පැවතුම් නොවැටහෙන බව ද අපේ සිතිවිලි තේරුම් ගත නොහැකි බව ද අපි දනිමු. මහ පොළොවේ එක් කොටසක් සහ තවත් කොටසක් අතර ඔහුට වෙනසක් නොමැති. මන්ද? ඔහු රාත්‍රියේ හොර රහසේ පැමිණෙන අමුත්තකු සේ ඔහුට අවශ්‍ය ඕනෑම දෙයක් මහ පොළවෙන් රැගෙන පිටව යන බැවිනි.

**සුදු මිනිසා**

සුදු මිනිසාට නම් මහපොළොව ඔහුගේ සොහොයුරකු නොව ඔහුගේ සතුරෙකි. එබැවින් ඔහු මහ පොළොවේ කොටසක් ජයගෙන එය පසුකර දමා තව කොටසක් යටත් කර ගැනීම සඳහා දිව යයි. සිය පියාගේ සොහොන් කොත ඇති ස්ථානය පවා අතහැර දමා හැඟීමක් නොමැතිව ව යයි. ඔහුගේ උරුමය වූ භූමිය පවා බලෙන් උදුරා ගනී. මේ කිසිවක් ඔහුට අගයක් නොමැති දේවල් ය. ඔහුගේ මව වූ මහ පොළොවටත්, ඔහුගේ සොහොයුරු වූ අහසටත් සළකන්නේ මිලට ගත හැකි සොරකම් කළ හැකි පාට පාට ඇට වැලක් නැත්නම් එළුවකු හෝ බැටළුවකුගේ ගණයෙහිලා ය. ඔහුගේ මේ අසීමිත තන්හාව නිසා මහ පොළොව දැවී ගොස් එය කවදා හෝ කාන්තාරයක් බවට පත්වීම නම් නිරනුමාන ය.

මට නම් ඔබ තේරුම් ගත නොහැකි ය. සුදු මිනිසාගේ නගරවල නිස්කලංක නිහඬ තැනක් ඇත්තේ ම නැත. වසන්තයේ අතු පතර සුළං රැළි ගැටෙන හඬත් ගුමු නද දෙන මීමැස්සන්ගේ මියැසියාවක් ඔවුන්ට තේරුම්ගත නොහැක්කේ ඇයි දැයි මට නොවැටහෙන්නේ මා වනචාරියකු නිසා විය හැකි ය. එහෙත් ඔබේ නගරවල ඇති නොරතෝංචියක් නොමැති කන්දොස්කිරියාව මගේ කණට වැටෙන්නේ අපහාසයක් ලෙසටයි. කැලෑ රොදක දඬුලේනකුගේ හැඬීමේ ඇති ශෝකී රාවය හෝ විලක් වටේ රැස් වී එකිනෙකා සමග රාත්‍රී කාලයේ වාද කරන මැඩියන් රැලක ගේ නාදය හෝ කන නොවැකෙන මිනිසකුගේ ජීවිතය ජීවිතයක් ද? රතු ඉන්දියන් මිනිසකු වූ මට සමහර විට අවබෝධයක් නැතුවා විය හැකි ය. එහෙත් රතු ඉන්දියන්වරු විල් තෙරක් මත සුළඟ ගැටී නිකුත්වන සිහින් හඬ ඇසීමටත්, මද්දහනේ වැටුණ වැස්සකින් සේදී පිරිසුදු වන සුළඟේ ඇති අපූරු සුවඳ ඇදීමටත් කැමති වෙති.


සුළඟ රතු ඉන්දියන් මිනිසාට වටිනා වස්තුවකි. සජීව සියල්ලෝ සුළඟ සමසේ බෙදා ගනිති. සතුන් මිනිසුන් සහ තුරුලිය එක ම සුසුමක හවුල් කරුවෝ කර ගනිති. තමා ආශ්වාස කරන සුළඟ සුදු මිනිසාට නම් එතරම් අගය ඇති බවක් නොපෙනේ. දින ගණනක් ම පණ අදිමින් සිටින කෙනෙකුට තමාගේ ම සිරුරෙන් පිටවන දුගඳ නො දැනෙන්නාක් මෙනි. රතු ඉන්දියන් මිනිසා වනචාරියකු බැවින් සමහර විට ඔහුට මේ කරුණු නොවැටහෙනවා විය හැකි ය.

අපි ඔබගේ යෝජනාවට යම් හෙයකින් එකඟ වුවහොත් සුළඟ අපට අගය ඇති වස්තුවක් බවත් සෑම සජීවි සත්වයෙක් ම එයින් ජීවය උරා ගනිමින් ජීවත් වන බවත් ඔබ වටහා ගත යුතු ය.

**හුස්ම රැල්ල**

අපේ මුතුන්මිත්තන්ට මුල් ම හුස්ම බිඳ දුන්නේත්, ඔවුන්ගේ අවසන් සුසුම් රැල්ල ආපසු ගත්තේත් අප අවට තිබෙන සුළඟ බව ඔබත් වටහා ගත යුතු ය. එසේ ම අප දරුවන්ට ප්‍රාණ නාලිය දෙන්නේත් මේ සුළඟම ය. අප ඔබට අපේ බිම විකුණුව හොත් ඔබ සුළඟ ප්‍රවේශමින් ආරක්ෂා කළ යුතු ය. එවිට සුදු මිනිසාටත් කුසුම්වල සුවඳින් පිරිගිය සුළං රැළිවල ඇති අපූරු නැවුම් බව විඳ ගත හැකි වනු ඇත.

අපි අපේ භූමිය ඔබට මිලකට දෙන්නට ඔබ කරන යෝජනාව ගැන සළකා බලන්නෙමු. එහෙත් එය කළ



හැක්කේ මා ඔබට පණවන එක් කොන්දේසියකට යටත්වයි. සුදු මිනිසා මෙම භූමියෙහි වසන සෑම සත්ව යෙකුට ම සිය සොහොයුරෙකුට මෙන් ම සැළකීමට පොරොන්දු විය යුතු ය. රතු ඉන්දියන් කරුවකු වූ මට එය වෙනත් කිසිම අයුරකින් කළ හැකි බවක් නොවැටහේ. ප්‍රේරි තැන්න මත මැරී වැටුණු දහසක් පමණ මීමුන්ගේ මළකුණු මා නෙත ගැටී ඇත. දිවෙන දුම්රියක් තුළ සිට තුවක්කු මානා ඔවුන්ට වෙඩි තබා මරා දමා ගොස් තිබුණේ සුදු මිනිසා ය. අප විසින් තනන ලද දුම් දමන යකඩ අශ්වයකු මීහරකෙකුට වඩා අපට වටිනා වස්තුවක් වී ඇත්තේ කෙසේ දැයි මට නම් නොවැටහේ. සතුන් නොමැති ලොවක වසන මිනිසාත් මිනිසෙක් ද? සියලුම සතුන් විනාශ වී ගියොත් මිනිසාට කෙතරම් පාළුවක් ඇති වේ ද? සතුන්ට වන විපත් මිනිසාටත් නිරනුමාන යෙන් ම සිදු වන්නේ ය. සියලු දේම එකිනෙකට සම්බන්ධව පවතිනි බැවිනි.

**මහපොළොව**

ඔබගේ දරුවන්ගේ පයට පෑගෙන මහපොළොව අපගේ මුතුන් මිත්තන් ගේ භස්මාවශේෂ තැන්පත් කරන පූජනීය භූමිය බැවින් එයට ගරු කළ යුතු බව ඔබගේ දරුවන්ට උගැන්විය යුතු ය. අපි අපේ දරුවන්ට උගැන් වූ දේවල් ඔබ ඔබේ දරුවන්ට ද කියා දිය යුතු ය.

මේ මහ පොළොව අපගේ මව බැවින් එයට වන සෑම හානියක් ම මිහිතලයේ දරුවන් වූ මිනිසුන්ට ද වන හානියක් බව අපි දරුවන්ට කියා දී ඇත්තෙමු. මිනිසුන් මහ පොළවට කෙල ගැසුවොත් එය සිය මවට කෙල ගැසීමකි. මෙය නම් අපි නිසැකින් ම දනිමු. මිනිසා මහ පොළවට අයත් සත්වයෙකි. මහ පොළව මිනිසාට අයත් වස්තුවක් නොවේ එකම පවුලක මිනිසුන් සමාන ලේවල බැම්මෙන් බැඳී සිටින අයුරින් ම පොළව මත ඇති සෑම දෙයක් ම එකිනෙකා හා සමව සම්බන්ධ වී පවතී. ජීවිතය නමැති ජාලය මිනිසා ගොතන ලද්දක් නොවේ. ඔහු එම ජාලය තුළ එක් සිහින් හුයක් පමණි.

ඔබ අපට වෙන් කර ඇති භූමි භාගයට ගොස් එහි පදිංචි වීම ගැන සළකා බැලිය යුතුව ඇත. අපි අපේ පාඩුවේ එහි සාමයෙන් ජීවත් වීමට උත්සාහ කරන්නෙමු. අපේ වර්ගයාට මිහිපිට ජීවත් වීමට ඉතිරි වී ඇති ඉතා කෙටි කාලය අපි කොහේ හෝ ගත කළත් කිම් ද? පරාජයෙන් හිස නමාගෙන මුළු ගැන් වී සිටින සිය පියවරුන් දැකීමට අපේ දරුවන් දැන් පුරුදු වී ඇත. ලැජ්ජාවෙන් මිරිකී සිටින අපේ නිර්භීත රණකාමීහු මත්පැන් වලින් හා රස කෑම වලින් සිය සිරුරු දූෂ්‍ය කර ගනිමින් අලසව කල් ගෙවති. ඉතින් අප අපට ඉතිරිව ඇති කෙටි කාලය කොහේ ගත කළත් මන්ද? එය එතරම් දිගු කලක් නම් නොවනු ඇත.


තවත් පැය කිහිපයක්, තවත් හේමන්ත සෘතු කිහිපයක් ගෙවී යද්දී මේ භූමියෙහි කලෙක නිදහසේ සැරිසරමින් උදාරව ජීවත්ව සිටි ගෝත්‍ර වලින් දැනට ඉතිරි වී කැලෑ වැදී කුඩා කණ්ඩායම් ලෙස සැරි සරන අපේ කුල දරුවන් ගෙන් සිය මුතුන් මිත්තන් ගේ සොහොන් කොත් අසලට පැමිණ දුක් වන්නටවත් කෙනකු ඉතිරි නොවනු ඇත. කලෙක අපිත් ඔබ මෙන්ම උසස් බලාපොරොත්තු රැසක් හදවතට තුරුළු කර ගත් ශ්‍රේෂ්ඨ ජාතියක්ව ජීවත්ව සිටියෙමු. එහෙත් මගේ ගෝත්‍රයේ අවසානය ළඟාවනු බලා සිටින මා දුක් විය යුතු ද? ගෝත්‍ර සෑදෙන්නේ මිනිසුන් ගෙනි. මිනිසුන් සාගරයේ රළ පොකුරු මෙන් ඇති නැති වෙති.

**දෙවියෝ**

සිය දෙවියන්වහන්සේ සමග මිතුරකු මෙන් කතා කරමින් ඔබ මොබ යන සුදු මිනිසා කවදා හෝ දෛවය ඉදිරියේ හිස නැමිය යුතු ය. එසේ නම් අප කවුරුත් එක ම පවුලක සොහොයුරන් විය යුතු නොවේ ද? අපි ඉවසා බලමු. අප අද දන්නා යම් දෙයක් හෝ සුදු මිනිසාටත් දැනගන්නට ලැබේවි. අපේ දෙවියන් ඔබේ දෙවියන් මයි. දෙවියන් වහන්සේ ඉඩමක් මෙන් ඔබට අයිති කරගත හැකි බව ඔබ සිතන බව මට පෙනේ. එහෙත් එය කළ නොහැකි කාර්යයකි. දෙවියන් වහන්සේ මිනිසා ගේ දෙවි කෙනෙක් නම් උන් වහන්සේ ගේ අපරිමිත කරුණාව සුදු මිනිසාටත් රතු මිනිසාටත් සමාන වන්නේ මය. උන් වහන්සේට මෙම ධරණී තලය අගනා වස්තුවකි. ධරණී තලයට හානියක් කිරීම එය මැවූ දෙවියන් වහන්සේට කරන අපහාසයකි. එබැවින් සුදු මිනිසාත් විනාශ වී යනු ඇත. සමහර විට අනිකුත් ජාතීන් විනාශ වූවාට වඩා කෙටි කාලයක් තුළ සුදු මිනිසා විනාශ වී යනු ඇත.

**පණනල**

අපට නොවැටහෙන යම් ගුප්ත හේතුවක් නිසා මෙම භූමියෙන් රතු මිනිසාත් යටත් කර ඔබේ ආධිපත්‍ය මෙහි පැතිරවීමට දෙවියන් වහන්සේ ඔබ මෙහි එවා ඇත. එහෙත් යම් දිනෙක දෙවියන් වහන්සේ දුන් එම ශක්තියෙන් හා ආලෝකයෙන් බැබලෙමින් ඔබ විනාශ වී යනු ඇත. කුළු මීමුන් මරා දමන්නේත්, නිදහසේ වනය තුළ දිවෙන සෙන්ධවයන් හීලෑ කරන්නේත් කඳු වැටි දිගේ කතා කරන කම්බි අදිමින් පරිසරයේ සොබා සිරිය කෙළෙසා දමන්නේත්, ජන ශූන්‍යව පැවති වනය මිනිස් දහඩිය ගඳින් අපවිත්‍ර කරන්නේත් කුමක්



උදෙසාදැයි අපට නම් නොවැටහේ. අද වන පෙත කොයිබට ද? විනාශ වී හමාර ය. උකුස්සන් කොයිබට ද? විනාශ වී හමාර ය. පවනට බඳු වේගයෙන් දිව යන අසුන් පිට නැගී නිදහසේ ගමන් කිරීමේ පුරුද්දට ආයුබෝවන් කීමේ අරුත කුමක් ද? ජීවත් වීම නැති කර දමා පණ නල රැක ගැනීම ඇරඹීමකි.

එබැවින් අප ඔබට මේ භූමිය මිලකට දීමට එකඟ වන්නේ අපට ජීවත් වීමට වෙන් කර දී ඇති භූමියට වී සිටීම සඳහා පමණකි. එහි අපට ඉතිරිව ඇති ඉතා වටිනා කාලය ගත කර මිය යන්නෙමු. අන්තිම රතු ඉන්දීයන් මිනිසා ගේ පණ නල සුළඟට මුසු වී ඔහු පිළිබඳ මතක සටහන් ගුවන් ගැබ පාවෙන වලාකුලකට මුසුව නිල් අහස් තලය සිසාරා ප්‍රේරි තැනිතලාවට උඩින් අහසේ ගමන් ගන්නා යම් දිනකට පසුවත් මෙම ධරණී තලයේ වාසය කළ මගේ මුතුන් මිත්තන්ගේ ඉතිහාසයේ ප්‍රෝංකාරය නොනැසී අමරණීයව පවතිනු ඇත. අලුත උපන් මොළකැටි බිළිඳා සිය මවගේ ළයෙහි හෘද ස්පන්දනයට ආදරය කළ අයුරින් ඔබද මෙම මිහිතලය ආදරය කරනු මැනවි. අප එය රැක බලාගත් අයුරින් ම ඔබත් එය රැක බලා ගනු මැනවි. ඔබේ මුළු ශක්තියත් ඔබේ මුළු හදවතත් එක් කැටි කර මෙම භූමිය ඔබේ දරුවන්ට උරුම කර දීම සඳහා මැනවින් රැක බලා ගනු මැනවි. එයට ගරු කරනු මැනවි.

අපි එකක් දනිමු. අප සියල්ලන්ට ම ඇත්තේ එකම දෙවි කෙනෙකි. උන් වහන්සේට මේ මහ පොළව අගය ඇති වස්තුවකි. සුදු මිනිසා ද දෛවයට යටත් විය යුතුම ය. එසේ නම් අපි සියල්ලෝ ම සොහොයුරන් නොවෙමු ද?

**සුදු මිනිසුන් ඇමෙරිකාවේ පදිංචි වීමෙන් පසු එහි මුල් පදිංචිකරුවන් වන රතු ඉන්දියන්වරුන්ට සිදු වූ බලවත්ම හානිය වූයේ ඔවුන්ගේ පාරම්පරික වාසභූමි අහිමි වීමයි. එවැනි අවස්ථාවක දී රතු ඉන්දියානු නායක සියටෙල් ඇමෙරිකානු ජනාධිපතිවරයා වෙත යවනු ලැබූ අති උද්වේග කර ඓතිහාසික ලියවිල්ල අනුසාරයෙනි.**

1992 ජූනි මාසයේ රියෝ ද ජෙනෙයිරෝහි පවත්වන ලද පරිසරය හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන් ගේ සමුළුව හෙවත් 'මිහිතල සමුළුව' විසින් සම්මත කරගන්නා ලද 21 වැනි න්‍යාය පත්‍රයේ 26 වැනි පරිච්ඡේදයෙන්

**ආදිවාසීන් සහ ඔවුන්ගේ ප්‍රජාවන්ගේ භූමිකාව පිළිගැනීම හා ශක්තිමත් කිරීම**

**කාර්ය පදනම**

"ආදිවාසීන්, එම ප්‍රජාවන් හා ඉඩම් අතර ඓතිහාසික පදනමක් පවතින අතර, ඔවුන් බොහෝ දෙනා එවැනි ඉඩම්වල මුල් පදිංචිකරුවන්ගෙන්, පැවත එන්නෝ වෙති. ලෝක ජනගහණයෙන් සැළකිය යුතු ප්‍රතිශතයක් ආදිවාසීහු හා එම ප්‍රජාවෝ නියෝජනය කරති. ස්වකීය ඉඩම් හා අදාළව ස්වාභාවික සම්පත් සහ පරිසරය සම්බන්ධයෙන් පරම්පරා ගණනාවක සිට දියුණු කළ විද්‍යාත්මක දැනුමක් ඔවුන් සතුයි. ආදිවාසීහු, කිසිදු බාධාවකින් හෝ අසාධාරණයකින් තොරව තම අයිතිවාසිකම් හා මූලික නිදහස් සියල්ල භුක්ති විඳිති. තම ඉඩම්වල කල් පවත්නා සංවර්ධන පරිචයන් වෙනුවෙන් මුළුමනින් ම සහභාගිවීමේ, ඔවුන් ගේ හැකියාව, ආර්ථික, සමාජයීය හා ඓතිහාසික ස්වභාවයේ සාධකවල ප්‍රතිඵලයක් ලෙස සීමා වන බව පෙනේ.

ස්වාභාවික පරිසරයත් එහි කල් පවතින සංවර්ධනය සහ ආදිවාසීන්ගේ සංස්කෘතික, සමාජයීය හා භෞතික සුභ සිද්ධිය අතර පවතින අන්තර් සබඳතාව සැළකිල්ලට ගෙන පාරිසරික වශයෙන් අහිතකර ඵලවිපාක ගෙන නොදෙන හෝ කල්පවතින සංවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ජාතික හා අන්තර් ජාතික වශයෙන් දරන ප්‍රයත්නවල දී ආදිවාසී ජනතාවගේ හා එම ප්‍රජාවන්ගේ භූමිකාව පිළිගත යුතුයි. එයට ඉඩකඩ සලසා දිය යුතු යි. එය ප්‍රවර්ධනය කොට ශක්තිමත් කළ යුතුයි."





සොබා